# පුරප්පාඩු

## <u>ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විවෘත බඳවා ගැනීම් - 2026</u>

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ **කාර්මික නිලධාරි ( සිවිල්) තනතුර** / කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ -3 සේවා ගණයේ **උද්‍යාන වැඩ මූලික තනතුර** / කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ -2 සේවා ගණයේ **ගාස්තු අයකිරීමේ සහකාර** තනතුර සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය**

**02. සුදුසුකම්**

2.1. **තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් 2026.04.06 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය .**

2.2 **වැටුප - තනතුර ස්ථිරය රා.පරි.ච.10/2025 හි අදාළ සේවා ගණය සඳහා වන වැටුප් පරිමානය වේ.**

**03.තනතුරු හා අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම්**

| තනතුර හා වැටුප් කේතය | පුරප්පාඩු පවතින උද්‍යානය | පුරප්පාඩු සංඛ්‍යාව | **වයස** (අයදුම්පත් භාර ගන්නා 2026.03.31 දිනට) | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 1.කාර්මික නිලධාරි MN-3 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව පේරාදෙණිය | 01 | **අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 නොවැඩි විය යුතුය.** | සිංහල/දෙමළ/ඉංග්‍රීසි/ භාෂාව හා ගණිතය ,විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. අ.පො.ස. උ /පෙළ විභාගයේ දී ගණිතය හෝ තාක්ෂණ වේදය විෂය ධාරාවේ සංයුක්ත ගණිතය , භෞතික විද්‍යාව , රසායන විද්‍යාව ඉංජිනේරු තාක්ෂණ හෝ තොරතුරු තාක්ෂණ ඇතුළුව ගණිතය හෝ තාක්ෂණ වේදය විෂයන් 3 ක් එකවර සමත් වී තිබීම . (සාමාන්‍ය ඉංග්‍රීසි සහ පොදු පරීක්ෂණය හැර ) | ජාතික වෘත්තීය කුසලතා (NVQ 6 ) මට්ටම තාක්ෂණික හෝ ඉංජිනේරු ඩිප්ලෝමාවක් |
| 2.ගාස්තු අයකිරීමේ සහකාර MN-1 | රාජකීය උද්භිද උද්‍යානය , පේරාදෙණිය<br>මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය , හම්බන්තොට<br>සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය , අවිසාවේල්ල<br>හක්ගල උද්භිද උද්‍යානය , හක්ගල | 01<br>01<br>02<br>01 | **අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 නොවැඩි විය යුතුය.** | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත් වී තිබීම. සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. | අදාළ නොවේ |
| 3.උද්‍යාන වැඩ මූලික MT-1 | වියළි කලාපීය උද්භිද උද්‍යානය , හම්බන්තොට<br>සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය , අවිස්සාවේල්ල | 01<br>01 | **අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 නොවැඩි විය යුතුය.** | සිංහල/දෙමළ/ඉංග්‍රීසි/ භාෂාව ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. | ජාතික වෘත්තීය කුසලතා (NVQ 5 ) මට්ටමට ඇතුළත් වන්නාවූ කෘෂිකර්ම / උද්‍යාන අලංකරණ /මල් වගාව හෝ තවාන් පාලනය සම්බන්ධ උද්භිද උද්‍යාන අංශයේ තාක්ෂණික පාඨමාලාවක් |

**04.** බඳවා ගන්නා ක්‍රමය **- සාමාන්‍ය දැනීම ,** බුද්ධි පරීක්ෂණය හා විෂයානු බද්ධ දැනුම පරීක්ෂා කරන ලිඛිත විභාගයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් (අතිරේක සුදුසුකම් පරීක්ෂාව ) පවත්වනු ලැබේ.
**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික වල පිටපත් ඔබ විසින් සහතික කර අයදුම්පත්‍රය සමග යොමු කළ යුතුය.**

**05** විභාග ගාස්තු රු. **600.00 කි . එම විභාග ගාස්තුව අධ්‍යක්ෂ ජනරාල් , ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව නමින් ලංකා බැංකුව පේරාදෙණිය ශාඛාවේ ඇති 7040743 අංක දරණ ගිණුමට අයදුම්කරුගේ නමින් බැර කළ යුතුය.** භාග ගාස්තු ගෙවන ආකාරය * මාර්ගගත මුදල් හුවමාරුව ( Online Transfer ) *බැංකු ගත කිරීම්

* **මුදල් බැර කිරීමට පෙර ගිණුම් අංකය තහවුරු කර ගන්න.** බැංකු ගත කරන්නේ නම් බැංකු කුවිතාන්සියේ පිටපතක් පැහැදිලිව පෙනෙන සේ අමුණන්න. එහි පිටුපස අයදුම්කරුගේ නම , ජා.හැ.අංකය ,ඉල්ලුම්කරන තනතුර ඇතුළු විස්තර සඳහන් කරන්න. මාර්ගගත ක්‍රමයට ගාස්තු ලෙවන්ගෙවන්නේ නම් ( **Online Transfer නම් screenshot** ) හෝ රිසිට් පතෙහි අයදුම්කරුගේ විස්තර සඳහන් කර මුද්‍රිතයක් ලබාගෙන අලවන්න.

**06.අයදුම්පත් යොමුකළ යුතු ආකාරය**

ඉහත තනතුරු සඳහා විභාගයට අදාල විෂය නිර්දේශය , වෘත්තීය සුදුසුකම් සහ අයදුම්පත් ආකෘතිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ www.botanicgardens.gov.lk දරණ වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.) " අධ්‍යක්ෂ ජනරාල් , ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ.පෙ. 14 ,පේරාදෙණිය" යන ලිපිනයට 2026.04.06 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **අයදුම්කරන තනතුර** සඳහන් කළ යුතුය .

අධ්‍යක්ෂ ජනරාල් ,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ,
පේරාදෙණිය.
2026 මාර්තු 17 දින . **විමසීම - 081- 2388654**